**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය - 2023**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 7,658,339 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,043,684 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,614,656 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව අධිකාරියේ වැඩසටහන් සඳහා වූ වියදම සියයට 71 කින් අඩුවීමත්, සමස්ථ වියදම සියයට 22 කින් අඩුවීමත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

අධිකාරිය වෙත ඉකුත් වර්ෂයේදී විදේශීය ප්‍රදාන රු. 7,063,075 ක් ලැබී තිබුණද සමාලෝචිත වර්ෂයේදී විදේශීය ප්‍රදාන ලැබී නොතිබුණු අතර රජයේ දේශීය මූලධන ප්‍රදාන ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. 2,573,300 කින්, එනම් සියයට 130 කින් වැඩි වී තිබුණි. අධිකාරියේ පුද්ගල පුද්ගල පඩිනඩි හා වැඩසටහන් සඳහා වූ වියදම පිළිවෙලින් රු. 4,204,690 කින් සහ රු. 6,464,553 කින් එනම් සියයට 26 කින් සහ 71 කින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් පිළිවෙලින් රු.566,465 ක් හා රු.301,490 ක් වැය කර මහජනතාවගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා "VNATA Media Violation" හා බලයලත් නිලධාරීන් වෙනුවෙන් "VNATA Authorized Officer's" යන ජංගම දුරකථන යෙදවුම් හඳුන්වා දී තිබුණි. නමුත් ණය කාඩ් මඟින් ගෙවිය යුතු වන මාසික Server using charges ගෙවීම සඳහා ණය කාඩ් පහසුකම් සහිත නිශ්චිත වැඩපිළිවෙලක් අධිකාරිය | අධිකාරියේ සභාපතිතුමාගේ ණය කාඩ්පත හරහා ගෙවීම් සිදු කිරීමේදී මාසිකව රු. 6000-8000ත් අතර ප්‍රමාණයක් පමණක් වැයවීම හේතුවෙන් සභාපතිතුමාගේ ණය කාඩ්පත හරහා මෙම ගෙවීම සිදු කරන ලදි. අධිකාරියේ සභාපතිවරුන් මාරු වන විට මෙම ණය කාඩ්පත් ඉවත් කර ගැනීමට සිදුවන හෙයින් ණය කාඩ්පත් පහසුකම අධිකාරිය වෙත ලබා ගැනීමට රජයේ බැංකු දෙකක් සමඟ සාකච්ඡා කල නමුත් එසේ | ජංගම දුරකථන යෙදවුම් සේවය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| විසින් සකස් කර නොතිබුණු අතර ඒ වෙනුවට අධිකාරියේ සභාපතිවරයාගේ පෞද්ගලික ණය කාඩ්පත මඟින් ගෙවීම් කර තිබුණි. මේ හේතුව නිසා අධිකාරියේ සභාපතිවරුන් මාරුවන විට කිසියම් කාලසීමාවක් මෙම යෙදවුම අක්‍රීය වීමක් සිදු වී තිබුණි. ඒ අනුව 2023 පෙබරවාරි සිට මැයි දක්වා ආසන්න වශයෙන් මාස 4 ක කාලයක් මෙම යෙදවුම අක්‍රිය වී තිබුණු අතර මෙම යෙදවුම් දෙක නැවත සක්‍රීය තත්වයට පත් කිරීමට රු.58,000 ක අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි. එසේම මෙම යෙදවුම් දෙක සංවර්ධනය කිරීම හා නඩත්තු කටයුතු වෙනුවෙන් සැපයුම්කරු සමඟ ලිඛිත එකඟතාවයකට එළඹී නොතිබුණි. | අධිකාරිය වෙත ණය කාඩ්පත් පහසුකම ලබා දීමට අපහසු බව එම බැංකු වෙතින් දන්වන ලදී. ඒ අනුව නව සභාපතිවරයාගේ ණය කාඩ්පත මඟින් Server Using Charges ගෙවීම් සිදු කරගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ සිදු කරන ලදී. එසේම 2023 වසරේ මුල් මාස වලදී Server Using Charges නොගෙවීම නිසා මෙම යෙදවුම 2023 පෙබරවාරි 01 වන දින ස්වයංක්‍රීයව අක්‍රීය වූ අතර යෙදවුම් නැවත සක්‍රීය කර ගැනීමට රු.58,000ක් වැය විය. 2023 වර්ෂයේදී මෙම යෙදවුම් නිර්මාණය කරන ලද ආයතනය සමඟ ගිවිසුම් ගතවීම පිළිබඳව විමසීමේදී රු.1,875,000 කට දමිළ හා ඉංග්‍රීසි භාෂාවන්ද ඇතුළත්ව යාවත්කාලීන කිරීමෙන් අනතුරුව ගිවිසුම් ගතවීමට කැමැත්ත පල කරන ලදී. ඒ අනුව ලිඛිත එකඟතිවයක්න් යුක්තව ගිවිසුම් ගත වීම සඳහා ඉහත මුදල වැය වේ. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ පුරප්පාඩු සංඛ්‍යාව 5 ක් වූ අතර 2024 අප්‍රේල් 30 දිනට එම පුරප්පාඩු සංඛ්‍යාව 6 දක්වා වැඩි වී තිබුණි. ඉහත පුරප්පාඩු අතරින් සාමාන්‍යාධිකාරී තනතුර 2022 ජුලි 27 වන දින සිට මේ දක්වාත්, පරිපාලන නිළධාරී තනතුර 2024 මාර්තු 04 දින සිට මේ දක්වාත් පුරප්පාඩුව පැවතුණි. එසේම පූර්ණ කාලීනව සේවයේ යෙදවීමේ අවශයතාවයක් ඇති උපදේශන සහ නීති නිලධාරී තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. | සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමට අදාල කටයුතු සම්බන්ධයෙන් අධිකාරිය විසින් දිගින් දිගටම සිදුකළ අතර, එම තනතුර පුරවා ගැනීමට අවශ්‍ය අනුමැතීන් මේ වන තෙක් අධිකාරීයට ලැබී නොමැත. මෙම තනතුර සඳහා විශ්‍රාමික නිලධාරියකු බඳවා ගැනීම වෙනුවෙන් සකස් කරන ලද අවසන් කැබිනට් පත්‍රිකාව සඳහා අදාල අනුමැතීන් මෙතෙක් ලැබී නොමැත.<br><br>පරිපාලන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට දැනටම අධිකාරිය කටයුතු සිදු කර ඇති නමුත් අදාල අනුමැතීන් තවමත් අධිකාරිය වෙත ලැබී නොමැති බැවින් එම අනුමැතීන් ලද වහාම බඳවා ගැනීමට අදාල කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරනු ඇත.<br>මනෝ උපදේශක හා නිතී නිලධාරි | අධිකාරියේ කටයුතු ක්‍රමානුකූලව සිදුකර ගෙන යා හැකි පරිදි පුරප්පාඩු තනතුරු වලට බඳවා ගැනීම් කිරීමට කටයුතු කල යුතුය. |

තනතුරු දෙක පූර්ණ කාලීනව යෙදවීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සම්පාදනය කරනු ඇත.

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට දින 60 ක් ප්‍රමාද වී විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | අධිකාරියේ ගණකාධිකාරී (නිත්‍ය) 2024 පෙබරවාරි මස 14 තෙක් ප්‍රසූත නිවාඩු ලබා සිටීමත්, ඒ වෙනුවට වැඩ බැලීම සිදු කල සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්ය බහුලත්වය මත අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම සම්බන්ධයෙන් කටයුතු කිරිමට ඉඩ ප්‍රස්ථා අඩුවෙන් ලැබී ඇති බවට අනාවරණය විය. අධිකාරියේ නිත්‍ය ගණකාධිකාරිනිය නැවත සේවයට වාර්තා කල පසු මූල්‍ය ප්‍රකාශන සකස් කර 2023 මාර්තු මස 25 දිනැති අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය පරිදි 2024.04.04 වන දින රැස්වූ අධිකාරියේ විගණන කමිටුවට ඉදිරිපත් කර 2024.04.29 වන දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන අනුමත කළ පසු 2024.04.30 වන දින විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලදී. ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් සිදුවීමට හේතු පිලිබඳව විශේෂ අවධානය යොමු කර නිසි කාල සීමාව තුල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිමටත්, ඊට පෙර විගණන කමිටුවෙහි නිර්දේශ ලබා ගන්නා බවත් ඔබ වෙත මෙමඟින් දැනුම් දීමට කැමැත්තෙමි. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාදයකින් තොරව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අධිකාරිය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අධිකාරිය වෙනුවෙන් අභ්‍යන්තර විගණක තනතුර අනුමත වී නොමැති අතර, රේඛිය අමාත්‍යාංශය වන සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණනයක් සිදු කල යුතු නමුත් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනය අංශයේ කාර්යය මණ්ඩලය හිගතාවය හේතුවෙන් සිදු කර නොමැත . | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුය. |